හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කිං කෝපරේෂන් (ලිමිටඩ්)

සීමාසහිත වගකීම් සමගින් හොංකොං හි ලියාපදිංචි කරන ලදී.

HSBC සමූහ ව්‍යාපාරය plc

ඒකාබද්ධ ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2021 ඇ.ඩො.මි	2020 ඇ.ඩො.මි
ශුද්ධ පොලී ආදායම	**26,489**	27,578
– පොලී ආදායම	**36,188**	41,756
– පොලී වියදම	**(9,699)**	(14,178)
ශුද්ධ ගාස්තු ආදායම	**13,097**	11,874
– ගාස්තු ආදායම	**16,788**	15,051
– ගාස්තු වියදම	**(3,691)**	(3,177)
වෙළඳාම සඳහා රඳවාගත් හෝ සාධාරණ අගය මත කළමණාකරණය කළ මූල්‍ය මෙවලම් වෙතින් ලද ශුද්ධ ආදායම	**7,744**	9,582
ලාබ හෝ පාඩු හරහා සාධාරණ අගය මත මණින ලද ආශ්‍රිත ව්‍යුත්පන්න ද ඇතුළත්ව, රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් හා වගකීම් වලින් ලත් ශුද්ධ ආදායම /(වියදම්)	**4,053**	2,081
දිගු කාලීන ණය හා ව්‍යුත්පන්නයන් වල සාධාරණ අගයෙහි වෙනස්වීම	**(182)**	231
ලාභ හෝ පාඩු හරහා අනිවර්යයෙන්ම සාධාරණ අගය මත මණින ලද වෙනත් මූල්‍ය මෙවලම් වල සාධාරණ අගයයන් හි වෙනස්වීම්	**798**	455
මූල්‍ය ආයෝජන වලින් අලාභ අඩුකළ පසු ලාභය	**569**	653
ශුද්ධ රක්ෂණ වාරික ආදායම	**10,870**	10,093
අනෙකුත් මෙහෙයුම් ආදායම	**502**	527
මුළු මෙහෙයුම් ආදායම්	**63,940**	63,074
ගෙවන ලද රක්ෂණ හිමිකම් හා ප්‍රතිලාභ රක්ෂණාවරණ හිමියන් වෙත ඇති වගකීම්වල වෙනස්වීම්	**(14,388)**	(12,645)
අපේක්ෂිත ණය හානි ගාස්තු සහ වෙනත් ණයවර		
අවදානම් ප්‍රතිපාදන වල වෙනස්වීම් සිදුවීමට පෙර ශුද්ධ මෙහෙයුම් ආදායම	**49,552**	50,429
අපේක්ෂිත ණයවර පාඩු හා වෙනත් ණයවර හානි වල වෙනස	**928**	(8,817)
ශුද්ධ මෙහෙයුම් ආදායම	**50,480**	41,612
සේවක වන්දි සහ ප්‍රතිලාභ	**(18,742)**	(18,076)
ආයතන සහ පරිපාලන වියදම්	**(11,592)**	(11,115)
දේපළ, පිරියත හා උපකරණ ක්ෂය වීම් සහ භාවිත අයිතිය ඇති වත්කම්	**(2,261)**	(2,681)
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය හා හානිකරණය	**(1,438)**	(2,519)
කීර්තිනාම අපචයවීම්	**(587)**	(41)
මුළු මෙහෙයුම් වියදම	**(34,620)**	(34,432)
මෙහෙයුම් ලාභය	**15,860**	7,180
ආශ්‍රිතයන් සහ බද්ධ ව්‍යාපාරයන්හි ලාභ කොටස්	**3,046**	1,597
බදුවලට පෙර ලාභය	**18,906**	8,777
බදු වියදම	**(4,213)**	(2,678)
කාලච්ඡේදය සඳහා ලාභය	**14,693**	6,099
මුලු ආදායමෙන්		
– ප්‍රධාන සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන්	**12,607**	3,898
– ප්‍රධාන සමාගමේ වරණීය කොටස් හිමියන්	**7**	90
– අනෙකුත් සමකොටස් දරන්නා	**1,303**	1,241
– සුළු කොටස් හිමියන් සඳහා වන ලාභය	**776**	870
කාලච්ඡේදය සඳහා ලාභය	**14,693**	6,099
	$	**$**
සාමාන්‍ය කොටසක් සඳහා මූලික ඉපැයීම්	**0.62**	0.19
සාමාන්‍ය කොටසක් සඳහා තනුක ඉපැයීම්	**0.62**	0.19

අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2021 ඇ.ඩො.මි	2020 ඇ.ඩො.මි
වර්ෂය සඳහා ලාභ/අලාභ	**14,693**	6,099
වෙනත් විස්තීරණ ආදායම්/(වියදම්)		
වෙනත් පරිපූර්ණ ආදායම් හරහා සාධාරණ අගය මත ණයවර මෙවලම්	**(2,139)**	1,750
– සාධාරණ වටිනාකම් ප්‍රතිලාභ/(පාඩු)	**(2,270)**	2,947
– ආදායම් ප්‍රකාශනයට නැවත වර්ගීකරණය කළ සාධාරණ වටිනාකම් ලැබීම්	**(464)**	(668)
– ආදායම් ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති අපේක්ෂිත ණයවර පාඩු	**(49)**	48
– ආදායම් බදු	**644**	(577)
මුදල් ධාරා ඉදිරි රැකුම්	**(664)**	471
– සාධාරණ වටිනාකම් අලාභ	**595**	(157)
– ආදායම් ප්‍රකාශයට වර්ග කළ සාධාරණ වටිනාකම් අලාභ	**(1,514)**	769
– බදු වියදම් හා වෙනත් චලනයන්	**255**	(141)
ආශ්‍රිත හා බද්ධ ව්‍යාපාර වල වෙනත් විස්තීරණ ආදායම් වල කොටස	**103**	(73)
– වර්ෂයට අදාල අගය	**103**	(73)
විනිමය හිඟය	**(2,393)**	4,855
ලාභ හෝ පාඩුවලින් පසුව ප්‍රතිවර්ගීකරණය කරනු නොලබන අයිතම:		
නිශ්චිත ප්‍රතිලාභ වත්කම්/වගකීම් නැවත ඇගයීම	**(274)**	834
– ආදායම් බදුවලට පෙර	**(107)**	1,223
– ආදායම් බදු	**(167)**	(389)
ස්වකීය ණයවර අවදානමෙහි සිදුවන වෙනස්වීම් ආරම්භයේදී හඳුනාගැනීම මත සාධාරණ අගය මත		
නම් කළ මූල්‍ය වගකීම් වල සාධාරණ වටිනාකමෙහි වෙනස්වීම	**531**	167
– ආදායම් බදුවලට පෙර	**512**	190
– ආදායම් බදු	**19**	(23)
වෙනත් පරිපූර්ණ ආදායම් හරහා සාධාරණ අගය මත නම් කළ වස්තුහාර මෙවලම්	**(446)**	212
– ආදායම් බදු වලට පෙර	**(443)**	212
– ආදායම් බදු	(3)	—
අධිඋද්ධමනයෙහි බලපෑම්	**315**	193
වර්ෂය සඳහා බදු අඩු කළ පසු වෙනත් විස්තීරණ ආදායම්/(වියදම්)	**(4,967)**	8,409
වර්ෂය සඳහා මළු විස්තීරණ ආදායම්/(වියදම්)	**9,726**	14,508
මුලු විස්තීරණ ආදායමෙන්		
– ප්‍රධාන සමාගමෙහි සමාන්‍ය කොටස් හිමියන්	**7,765**	12,146
– ප්‍රධාන සමාගමෙ වරණීය කොටස් හිමියන්	**7**	90
– අනෙකුත් සමකොටස් දරන්නන්	**1,303**	1,241
– සුළු කොටස් හිමියන්ට අයිති කොටස්	**651**	1,031
වර්ෂය සඳහා සමස්ත විස්තීරණ ආදායම	**9,726**	14,508

ගනුදෙනුකරුවන්ගෙන් ණය හා අයවිය යුතු මුදල් - උප පලය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2021 ඇ.ඩො.මි	2020 ඇ.ඩො.මි
සුළු පරිමාණ බැංකුකරණ සහ ධන කළමනාකරණ	**488,786**	469,186
වාණිජ බැංකුකරණ	**349,126**	343,182
ගෝලීය බැංකුකරණ සහ වෙළෙඳපොළ	**207,162**	224,364
වෙනත්	**740**	1,255
එකතුව	**1,045,814**	1,037,987

ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ගිණුම් ප්‍රකාශන

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	20201 ඇ.ඩො.මි	2020 ඇ.ඩො.මි
බදු වලට පෙර ලාභය	**18,906**	8,777
මුදල් නොවන අයිතම සඳහා යථාවත් කිරීම්		
ක්ෂයවීම, ක්‍රමක්ෂයවීම සහ අපචයවීම	**4,286**	5,241
ආයෝජන ක්‍රියාකාරකම් වලින් දළ ලාභය	**(647)**	(541)
ආශ්‍රිතයන් හා බද්ධ ව්‍යාපාරවල ලාභ කොටස්	**(3,046)**	(1,597)
පරිපාලිත, ව්‍යාපාර, ආශ්‍රිත සමාගම් සහ හවුල් ව්‍යාපාර බැහැරකිරීමෙන් ලද (ලාභ)/පාඩු	**-**	-
අයකරගැනීම් හා වෙනත් ණයවර හානි ගාස්තු ද ඇතුළත් අපේක්ෂිත ණයවර පාඩු වල වෙනස්වීම්	**(519)**	9,096
විශ්‍රාමික වැටුප් ඇතුලු වෙන්කිරීම්	**1,063**	1,164
කොටස් මත පදනම් වූ ගෙවීම් වියදම්	**467**	433
බදුවලට පෙර ලාභයෙහි ඇතුළත් මුදල්-නොවන වෙනත් අයිතම	**510**	(906)
විනිමය හුවමාරු වෙනස්කම් ඉවත්කිරීම	**18,937**	(25,749)
මෙහෙයුම් වත්කම් හා වගකීම්වල වෙනස්කම්		
ශුද්ධ ආන්තික සුරැකුම්පත් සහ ව්‍යුත්පන්නවල වෙනස්කම්	**(9,226)**	13,150
බැංකුව සහ ගනුදෙනුකරුවන් වෙත වන ණය සහ අත්තිකාරම්වල වෙනස්කම්	**(11,014)**	(14,131)
ප්‍රති-විකුණුම් ගිවිසුම්වල වෙනස්කම් - ආන්තික නොවන	**552**	9,950
නම් කළ සහ නොඑසේ නම් අනිවාර්යයෙන් සාධාරණ අගය මත මණින ලද මූල්‍ය වත්කම් වල වෙනස්වීම්	**(4,254)**	(1,962)
වෙනත් වත්කම්වල වෙනස්කම්	**19,899**	(19,610)
බැංකු සහ ගනුදෙනුකාර ගිණුම් වෙතින් තැන්පතුවල වෙනස්කම්	**95,703**	226,723
ප්‍රතිමිලදීගැනීම් ගිවිසුම්වල වෙනස්කම් - ආන්තික නොවන	**14,769**	(28,443)
ණය සුරැකුම්පත් නිකුතුවල වෙනස්කම්	**(16,936)**	(9,075)
සාධාරණ වටිනාකම් මත නිශ්චය කළ මූල්‍ය වගකීම්වල වෙනස්කම්	**(11,425)**	(6,630)
වෙනත් වගකීම්වල වෙනස්කම්	**(10,935)**	20,323
ආශ්‍රිත සමාගම් වලින් ලද ලාභාංශ	**808**	761
නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් සඳහා ගෙවූ දායකත්වයන්	**(509)**	(495)
ගෙවන ලද බදු	**(3,077)**	(4,259)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් ශුද්ධ මුදල්	**104,312**	182,220
මූල්‍ය ආයෝජන මිලදී ගැනීම්	**(493,042)**	(496,669)
මූල්‍ය ආයෝජන අලෙවිකිරීම් හා කල්පිරීම් වලින් ලත් ආදායම්	**521,190**	476,990
දේපල, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ මිලදී ගැනීමෙන් සහ විකිණීමෙන් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ	**(1,086)**	(1,446)
ගනුදෙනුකරුවන් හා ණය ගිණුම් බැහැර කිරීම මගින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**3,059**	1,362
අස්පෘශ්‍ය වත්කම් වල ශුද්ධ ආයෝජන	**(2,479)**	(2,064)
අනුබද්ධිත ආයතන, ව්‍යාපාර, ආශ්‍රිතයන් සහ හවුල් ව්‍යාපාර බැහැරකිරීම් මත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(106)**	(603)
ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් ශුද්ධ මුදල්	**27,536**	(22,430)
සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන සහ හිමිකම් උපකරණ නිකුතු	**1,996**	1,497
කොටස් අවලංගු කිරීම	**(707)**	—
වෙළෙඳපොල සැකසීම් හා ආයෝජන අරමුණු සඳහා ස්ව කොටස් අලෙවි කිරීම්/(මිලදී ගැනීම්) ශුද්ධ මුදල් ප්‍රවාහ	**(1,386)**	(181)
වරණීය කොටස් නිදහස් කිරීම සහ හිමිකම් උපකරණ	**(3,450)**	(398)
ආපසු ගෙවන ලද ද්විතීයික ණය ප්‍රාග්ධනය	**(864)**	(3,538)
ප්‍රධාන සමාගමෙහි කොටස් හිමියන් සහ පාලනය නොකරන කොටස් හිමියන් වෙත ගෙවන ලද ලාභාංශ	**(6,383)**	(2,023)
මූල්‍යකරන ක්‍රියාකාරකම් වෙතින් ශුද්ධ මුදල්	**(10,794)**	(4,643)
මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	**121,054**	155,147
ජනවාරි 01 දින වන විට මුදල් සහ මුදල් හා සමාන දෑ	**468,323**	293,742
මුදල් සහ මුදල් හා සමාන දෑ සම්බන්ධයෙන් විනිමය හුවමාරු වෙනස්කම්	**(15,345)**	19,434
දෙසැම්බර් 31 දින වන විට මුදල් සහ මුදල් හා සමාන දෑ	**574,032**	468,323
මුදල් හා මුදල් සමාන දෑ සමන්විත		
මහ බැංකුවේ පවතින මුදල් සහ ශේෂයන්	**403,018**	304,481
වෙනත් බැංකු වෙතින් අයකරගනිමින් පවතින අයිතම	**4,136**	4,094
බැංකු වෙත එක් මාසයක හෝ ඊට අඩු ණය සහ අත්තිකාරම්	**55,705**	51,788
බැංකු සමග පවතින එක් මාසයක හෝ ඊට අඩු ණය සහ අත්තිකාරම්	**76,658**	65,086
මාස තුනකට අඩු භාණ්ඩාගාර බිල්පත්, වෙනත් බිල්පත් සහ තැන්පතු සහතික	**28,488**	30,023
	11,241	17,194
අඩු කළා- වෙනත් බැංකු වෙත සම්ප්‍රේෂණය කරමින් පවතින අයිතම	**(5,214)**	(4,343)
දෙසැම්බර් 31 වන දිනට මුදල් හා මුදල් සමාන දෑ	**574,032**	468,323

IFRS 9 හි හානි අවශ්‍යතා ආදේශ කරන ලද මූල්‍ය මෙවලම් වල සාරාංශය

	31 දෙසැම්බර් 2021		31 දෙසැම්බර් 2020 දිනට	
	දළ ධාරණ/ නාමික අගය ඇ.ඩො.මි	**අපේක්ෂිත ණය අලාභ සඳහා ප්‍රතිභාග ඇ.ඩො.මි**	දළ ධාරණ/ නාමික අගය ඇ.ඩො.මි	අපේක්ෂිත ණය අලාභ සඳහා ප්‍රතිභාග ඇ.ඩො.මි
ආපසු ගෙවූ පිරිවැය මත ගනුදෙනුකරුවන්ගෙන් ණය හා අයවිය යුතු මුදල්	**1,057,231**	**(11,417)**	1,052,477	(14,490)
– පුද්ගලික	**478,337**	**(3,103)**	460,809	(4,731)
– සංස්ථාපිත සහ වාණිජ	**513,539**	**(8,204)**	527,088	(9,494)
– බැංකු නොවන මූල්‍ය ආයතන	**65,355**	**(110)**	64,580	(265)
ආපසු ගෙවූ පිරිවැය මත බැංකු මගින් ණය හා අයවිය යුතු මුදල්	**83,153**	**(17)**	81,658	(42)
ආපසු ගෙවූ පිරිවැය මත වෙනත් මූල්‍ය වත්කම්	**880,351**	**(193)**	772,408	(175)
– අතැති මුදල් සහ මහ බැංකුවේ ඇති ශේෂයන්	**403,022**	**(4)**	304,486	(5)
– අනෙකුත් බැංකු වලින් රැස් කිරීම්	**4,136**	**—**	4,094	—
– ණය ගැති භාවය පිළිබඳව හොංකොං රජයේ සහතික පත්	**42,578**	**—**	40,420	—
– ප්‍රති විකුණුම් ගිවිසුම් - වෙළඳ නොවන	**241,648**	**—**	230,628	—
– මූල්‍ය ආයෝජන	**97,364**	**(62)**	88,719	(80)
– කළින් ගෙවීම්, ලැබිය යුතු ආදායම් සහ වෙනත් වත්කම්	**91,603**	**(127)**	104,061	(90)
ශේෂ පත්‍රයේ ඉදිරියට ගෙනයන සමස්ත දළ මුදල් ප්‍රමාණය	**2,020,735**	**(11,627)**	1,906,543	(14,707)
ණය හා වෙනත් ණය ආශ්‍රිත කැපවීම්	**627,637**	**(379)**	659,783	(734)
– පුද්ගලික	**239,685**	**(39)**	236,170	(40)
– සංස්ථාපිත සහ වාණිජ	**283,625**	**(325)**	299,802	(650)
– බැංකු නොවන මූල්‍ය ආයතන	**104,327**	**(15)**	123,811	(44)
මූල්‍යමය ඇපවීම්	**27,795**	**(62)**	18,384	(125)
– පුද්ගලික	**1,130**	**—**	900	(1)
– සංස්ථාපිත සහ වාණිජ	**22,355**	**(58)**	12,946	(114)
– බැංකු නොවන මූල්‍ය ආයතන	**4,310**	**(4)**	4,538	(10)
නාමික අගයෙන් යුත් මුළු අප-ශේෂපත්‍රය	**655,432**	**(441)**	678,167	(859)
	2,676,167	**(12,068)**	2,584,710	(15,566)

ඒකාබද්ධ ශේෂ පත්‍රය

දෙසැම්බර් 31 දිනට	2021 ඇ.ඩො.මි	2020 ඇ.ඩො.මි
වත්කම්		
අතැති මුදල් සහ මහ බැංකුවේ ඇති ශේෂයන්	**403,018**	304,481
අනෙකුත් බැංකු වලින් රැස් කිරීම්	**4,136**	4,094
ණය ගැති භාවය පිළිබඳව හොංකොං රජයේ සහතික පත්	**42,578**	40,420
වෙළෙඳ වත්කම්	**248,842**	231,990
නම් කළ සහ නොඑසේ නම් අනිවාර්යයෙන් සාධාරණ අගය මත ලාභ හෝ පාඩු මත මණින ලද මූල්‍ය වත්කම්	**49,804**	45,553
ව්‍යුත්පන්නයන්	**196,882**	307,726
බැංකු වලට දුන් ණය සහ අත්තිකාරම්	**83,136**	81,616
ගනුදෙනු කරුවන්ට දුන් ණය සහ අත්තිකාරම්	**1,045,814**	1,037,987
ප්‍රති විකිනුම් ගිවිසුම් - වෙළෙඳ නොවන	**241,648**	230,628
මූල්‍ය ආයෝජන	**446,274**	490,693
කළින් ගෙවීම්, ලැබිය යුතු ආදායම් සහ වෙනත් වත්කම්	**139,982**	156,412
පවතින බදු වත්කම්	**970**	954
ආශ්‍රිතයන්හි හා බද්ධ ව්‍යාපාරයන්හි අයිතිය	**29,609**	26,684
කීර්තිනාමය සහ අස්පෘශ්‍ය වත්කම්	**20,622**	20,443
විලම්බිත බදු වත්කම්	**4,624**	4,483
මුළු වත්කම්	**2,957,939**	2,984,164
වගකීම් සහ ස්කන්ධ ප්‍රාග්ධනය		
වගකීම්		
සංසරණයේ පවතින හොංකොං මුදල් නෝට්ටු	**42,578**	40,420
බැංකු විසින් කළ තැන්පතු	**101,152**	82,080
ගනුදෙනු කරුවන්ගේ ගිණුම්	**1,710,574**	1,642,780
ප්‍රති මිලදී ගැනුම් ගිවිසුම් - වෙළෙඳ නොවන	**126,670**	111,901
වෙනත් බැංකු වෙතට සම්ප්‍රේෂණය වෙමින් පවතින අයිතමයන්	**5,214**	4,343
වෙළෙඳ වගකීම්	**84,904**	75,266
සාධාරණ අගයට නිශ්චය කරන ලද මූල්‍ය බැරකම්	**145,502**	157,439
ව්‍යුත්පන්නයන්	**191,064**	303,001
නිකුත් කළ ණය සුරැකුම්පත්	**78,557**	95,492
උපචිතයන්, විලම්බිත ආදායම් සහ වෙනත් වගකීම්	**123,778**	128,624
පවතින බදු වගකීම්	**698**	690
රක්ෂණ ගිවිසුම් නිකුතුව මත බැරකම්	**112,745**	107,191
අනෙකුත් වෙන් කිරීම්	**2,566**	3,678
විලම්බිත බදු වගකීම්	**4,673**	4,313
අනෙකුත් උපකාරක වගකීම්	**20,487**	21,951
මුළු වගකීම්	**2,751,162**	2,779,169
ස්කන්ධ ප්‍රාග්ධනය		
කැඳවූ කොටස් ප්‍රාග්ධනය	**10,316**	10,347
කොටස් අධිමිල ගිණුම	**14,602**	14,277
අනෙකුත් හිමිකම් උපකරණ	**22,414**	22,414
වෙනත් සංචිත	**6,460**	8,833
රඳවාගත් ලාභ	**144,458**	140,572
කොටස් හිමියන් සතු මුළු හිමිකම් ප්‍රාග්ධනය	**198,250**	196,443
සුළු කොටස් හිමියන් සතු ප්‍රාග්ධනය	**8,527**	8,552
මුළු ස්කන්ධ ප්‍රාග්ධනය	**206,777**	204,995
සමස්ත වගකීම් හා වස්තුහාර	**2,957,939**	2,984,164

ගනුදෙනුකරුවන්ගේ ගිණුම් - උප පලය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2021 ඇ.ඩො.මි	2020 ඇ.ඩො.මි
සුළු පරිමාණ බැංකුකරණ සහ ධන කළමනාකරණ	**859,029**	834,759
වාණිජ බැංකුකරණ	**506,688**	470,428
ගෝලීය බැංකුකරණ සහ වෙළෙඳපොළ	**344,205**	336,983
වෙනත්	**652**	610
එකතුව	**1,710,574**	1,642,780

කාර්ය සාධන අනුපාත (%)

	2022 සැප්තැම්බර් 30 දිනට	2021 දෙසැම්බර් 31 දිනට	2021 දෙසැම්බර් 31 දිනට
සාමාන්‍ය සමකොටස් ස්ථර 1	**13.4**	15.8	15.9
මූලික ප්‍රාග්ධනය (පළමු පෙළ ප්‍රාග්ධනය)	**15.8**	18.6	18.7
මුළු ප්‍රාග්ධනය	**18.1**	21.2	21.5
තෝලන අනුපාතය	**5.4**	5.2	5.5
ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (%) - (අවම අවශ්‍යතාවය - 100%)	**127**	138	139
සාමාන්‍ය කොටස් හිමියන්ගේ සාමාන්‍ය ප්‍රාග්ධන හිමිකම මත ප්‍රතිලාභ*	**8.0**	7.1	2.3
ස්පෘශ්‍ය කොටස් හිමියන්ගේ සාමාන්‍ය ප්‍රාග්ධන හිමිකම මත ප්‍රතිලාභ*	**9.2**	8.3	3.1

*2022 කාලපරිච්ඡේදය සඳහා සාමාන්‍ය කොටස් හිමියන්ගේ ස්කන්ධ ප්‍රාග්ධනයේ සාමාන්‍ය මත ප්‍රතිලාභ සහ ස්පෘශ්‍ය ස්කන්ධ ප්‍රාග්ධනයේ සාමාන්‍ය මත ප්‍රතිලාභ වාර්ෂික පදනමින් ගනනය කෙරේ.

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම් පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය

	කැඳවූ කොටස් ප්‍රාග්ධනය ඇ.ඩො.මි	අනෙකුත් ස්කන්ධ උපකරණ ඇ.ඩො.මි	රඳවාගත් ලාභ ඇ.ඩො.මි	වෙනත් සංචිත: විකිණීම සඳහා තිබෙන වත්කම්වල සාධාරණ අගය සඳහා සංචිතය ඇ.ඩො.මි	වෙනත් සංචිත: මුදල් ප්‍රවාහ සඳහා ගෙවීන් සංචිතය ඇ.ඩො.මි	වෙනත් සංචිත: විදේශ විනිමය සංචිතය ඇ.ඩො.මි	වෙනත් සංචිත: ඒකාබද්ධකරණ සංචිතය ඇ.ඩො.මි	කොටස් හිමියන් සතු මුළු හිමිකම් ප්‍රාග්ධනය ඇ.ඩො.මි	සුළු කොටස් හිමියන් සතු ප්‍රාග්ධනය ඇ.ඩො.මි	මුළු ප්‍රාග්ධනය ඇ.ඩො.මි
2021 ජනවාරි 1 දිනට	24,624	22,414	140,572	1,816	457	(20,375)	26,935	196,443	8,552	204,995
කාලච්ඡේදය සඳහා වූ ලාභය	—	—	13,917	—	—	—	—	13,917	776	14,693
අනෙකුත් විස්තීරණ ආදායම් (බදු අඩුකළ පසු)	—	—	661	(2,455)	(654)	(2,394)	—	(4,842)	(125)	(4,967)
– වෙනත් පරිපූර්ණ ආදායම් හරහා සාධාරණ අගය මත මණින ලද ණය වෙමලම්	—	—	—	(2,105)	—	—	—	(2,105)	(34)	(2,139)
– වෙනත් පරිපූර්ණ ආදායම් හරහා සාධාරණ අගය මත නම් කළ වස්තුහාර මෙවලම්	—	—	—	(350)	—	—	—	(350)	(96)	(446)
– මුදල් ප්‍රවාහ සම්බන්ධ ඉදිරි රැකුම	—	—	—	—	(654)	—	—	(654)	(10)	(664)
– ස්වකීය ණයවර අවදානම හේතුවෙන්, සාධාරණ වටිනාකම මත නම් කළ මූල්‍ය වගකීම්වල සාධාරණ වටිනාකම පිළිබඳව සිදුවන වෙනස්කම්	—	—	531	—	—	—	—	531	—	531
– වත්කම්/බැරකම් වල නිශ්චිත ප්‍රතිලාභ නැවත ඇගයීම	—	—	(288)	—	—	—	—	(288)	14	(274)
– ආශ්‍රිතයන් සහ බද්ධ ව්‍යාපාරයන්හි අනෙකුත් විස්තීරණ ආදායම	—	—	103	—	—	—	—	103	—	103
– අධිඋද්ධමනයෙහි බලපෑම්	—	—	315	—	—	—	—	315	—	315
– විදේශ විනිමය අනුපාතික වෙනස්වීම්	—	—	—	—	—	(2,394)	—	(2,394)	1	(2,393)
කාලච්ඡේදය සඳහා මුලු විස්තීරණ ආදායම	—	—	14,578	(2,455)	(654)	(2,394)	—	9,075	651	9,726
සේවක කොටස් සැළසුම් යටතේ නිකුත් කළ කොටස්	354	—	(336)	—	—	—	—	18	—	18
නිකුත් කරන ලද ප්‍රාග්ධන සුරැකුම්පත්	—	2,000	(4)	—	—	—	—	1,996	—	1,996
නිකුත් කළ ප්‍රාග්ධන සුරක්ෂිතයන්	—	—	(5,790)	—	—	—	—	(5,790)	(593)	(6,383)
කොටස් හිමියන් සඳහා ලාභාංශ	—	(2,000)	—	—	—	—	—	(2,000)	—	(2,000)
සුරක්ෂිතයන් නිදහස් කරවීම	—	—	(3,065)	—	—	—	3,065	—	—	—
කොටස් පදනම් කරගත් ගෙවීම් විධිවිධානවල පිරිවැය	—	—	467	—	—	—	—	467	—	467
කොටස් අවලංගු කිරීම	(60)	—	(2,004)	—	—	—	60	(2,004)	—	(2,004)
අනෙකුත් ගැලපීම්	—	—	40	5	—	—	—	45	(83)	(38)
2021 දෙසැම්බර් 31 දිනට	24,918	22,414	144,458	(634)	(197)	(22,769)	30,060	198,250	8,527	206,777

මූල්‍ය උපකරණ අගය කිරීමේ පදනම මත විශ්ලේෂණය
2021 දෙසැම්බර් 31 දිනට

	ආපසු ගෙවූ පිරිවැය ඇ.ඩො.මි	ලාභ හෝ පාඩු හරහා ලද සාධාරණ වටිනාකම ඇ.ඩො.මි	වෙනත් පරිපූර්ණ ආදායම් හරහා ලද සාධාරණ වටිනාකම ඇ.ඩො.මි	එකතුව ඇ.ඩො.මි
මූල්‍ය වත්කම්				
අතැති මුදල් සහ මහ බැංකුවේ ඇති ශේෂයන්	403,018			**403,018**
අනෙකුත් බැංකු වලින් රැස් කිරීම්	4,136			**4,136**
ණය ගැති භාවය පිළිබඳව හොංකොං රජයේ සහතික පත්	42,578			**42,578**
වෙළෙඳ වත්කම්		248,842		**248,842**
නම් කළ සහ නොඑසේ නම් අනිවාර්යයෙන් සාධාරණ අගය මත ලාභ හෝ පාඩු මත මණින ලද මූල්‍ය වත්කම්		49,804		**49,804**
ව්‍යුත්පන්නයන්		196,882		**196,882**
බැංකු වලට දුන් ණය සහ අත්තිකාරම්	83,136			**83,136**
ගනුදෙනු කරුවන්ට දුන් ණය සහ අත්තිකාරම්	1,045,814			**1,045,814**
ප්‍රති විකිනුම් ගිවිසුම් - වෙළෙඳ නොවන	241,648			**241,648**
මූල්‍ය ආයෝජන	97,302		348,972	**446,274**
	1,917,632	495,528	348,972	2,762,132
මූල්‍ය වගකීම්				
සංසරණයේ පවතින හොංකොං මුදල් නෝට්ටු	42,578			**42,578**
බැංකු විසින් කළ තැන්පතු	101,152			**101,152**
ගනුදෙනු කරුවන්ගේ ගිණුම්	1,710,574			**1,710,574**
ප්‍රති මිලදී ගැනුම් ගිවිසුම් - වෙළෙඳ නොවන	126,670			**126,670**
වෙනත් බැංකු වෙතට සම්ප්‍රේෂණය වෙමින් පවතින අයිතමයන්	5,214			**5,214**
වෙළෙඳ වගකීම්		84,904		**84,904**
සාධාරණ අගයට නිශ්චය කරන ලද මූල්‍ය බැරකම්		145,502		**145,502**
ව්‍යුත්පන්නයන්		191,064		**191,064**
නිකුත් කළ ණය සුරැකුම්පත්	78,557			**78,557**
රක්ෂණ ගිවිසුම් නිකුතුව මත බැරකම්	112,745			**112,745**
අනෙකුත් උපකාරක වගකීම්	20,487			**20,487**
	2,197,977	421,470	-	2,619,447

ඉහත සංක්ෂිප්ත කර ඇති මූල්‍ය තොරතුරු උපුටා ගන්නා ලද්දේ, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන HSBC සමූහ ව්‍යාපාරය plc හි වාර්ෂික වාර්තා වලිනි.

HSBC හෝල්ඩින් පීඑල්සී ව්‍යාපාරික පාලන වාර්තාවේ සාරාංශය 2021

මෙහි පහත දක්වා ඇති තොරතුරු සහ යොමුකිරීම් මගින් දක්වා ඇති තොරතුරු 20201 වාර්ෂික වාර්තාවේ සහ ගිණුම් වල ("වාර්ෂික වාර්තාව") පිටු අංක 218 සිට 296 දක්වා අන්තර්ගත වී ඇති HSBC හෝල්ඩිංස් පීඑල්සී ('HSBC') හි ආයතනික පාලන වාර්තාවේ සාරාංශයකි.

අධ්‍යක්ෂ මණ්ඩලය, එහි භූමිකාව, අධ්‍යක්ෂවරයාගේ වගකීම්, පැමිණීම සහ බලය

ව්‍යාපාර සමූහයේ දීර්ඝකාලීන සාර්ථකත්වය ප්‍රවර්ධනය කිරීමට සහ ආයෝජකයින්ට තිරසාර අගයක් ලබාදීමට සහ එකත්වය හා විවාදය පිළිබඳ සංස්කෘතියක් දිරිගැන්වීමට අධ්‍යක්ෂ මණ්ඩලය ඉලක්ක කරයි. සමූහයේ සභාපතිතුමා විසින් මෙහෙයවනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අනෙකුත් වගකීම් අතර, සමූහයේ දීර්ඝකාලීන සාර්ථකත්වය ප්‍රවර්ධනයට සහ ආයෝජකයන්ට තිරසාර වටිනාකම් ලබාදීමට සමූහයේ ක්‍රමෝපායයන් සහ අරමුණු සකස් කිරීමට හා අනුමත කිරීමට සහ සමූහයේ අභිප්‍රායයන්, ක්‍රමෝපාය සහ අභිමත සංස්කෘතියට අනුව වන වටිනාකම් ආදිය අධීක්ෂණයට සහ ගැළපීමට සමූහයේ අවදානම් රුචිය සැකසීමට සහ සමූහයේ අවදානම් පිළිබඳව අධීක්ෂණය ක්‍රමෝපාය ඉලක්ක ළඟා කරගැනීම සඳහා ප්‍රාග්ධන සහ මෙහෙයුම් සැලසුම් අනුමත කිරීම සහ අධීක්ෂණය සහ සිදුවන ගනුදෙනු අනුමත කිරීම යන කාර්යයන් ද වේ. තවද, අධ්‍යක්ෂ මණ්ඩල රීති ද ඇතුළත් ව අධ්‍යක්ෂවරුන්ගේ පත්වීම් අනුමත කිරීම, සහ සමූහයේ සමස්ත වාණිජ පාලන සැකසුම් සමාලෝචනය කිරීම. අධ්‍යක්ෂ මණ්ඩලය සතු බලය, අදාළ නීති, රෙගුලාසි සහ HSBC හි සාංගමික ව්‍යවස්ථාවලියට විෂය වේ.

සභාපතිවරයාගේ කමිටුව

සභාපතිවරයාගේ කමිටුව කැඳවනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට නියමිත කාලයන් අතරතුර දී මණ්ඩල තත්කාර්යයන් සහ දෛනික කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නම්‍යශීලීත්වයක් ලබාදීම සඳහා ය. සාකච්ඡාවට බඳුන්වීමට නියමිත යෝජිත කරුණු වල ස්වභාවය අනුව තීරණය කරනු ලබන සාමාජිකයන් රැස්වීම එහිදී සිදු කෙරෙයි. සභාපතිවරයාගේ කමිටුව සහභාගී වන ලෙස සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට ආරාධනා කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය අතර සබඳතාව

ව්‍යාපාරයේ දෛනික කටයුතු කළමනාකරණය සහ ක්‍රමෝපායයන් ක්‍රියාවට නැංවීමේ කටයුතු, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමූහයේ ප්‍රධාන විධායක වෙත පැවරීම සිදුකෙරෙයි. ගෝලීය ව්‍යාපාරයන්හි ප්‍රධාන විධායක නිලධාරීන්, කලාපීය ප්‍රධාන විධායක නිලධාරීන් සහ අංශ ප්‍රධානීන් ඇතුළත් වන ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව සාමාජිකයන්ගෙන් සැදුනු විධායක කමිටුවක් වන, සමූහයේ විධායක කමිටුව (GEC) විසින් සිදුකරනු ලබන නිර්දේශ සහ උපදේශන අනුව සමූහයේ කළමනාකාරිත්වය සම්බන්ධයෙන් සමූහයේ ප්‍රධාන විධායක වෙත සහය දැක්වීම හා උපදෙස් ලබාදීම සිදුකෙරෙයි.

නාමකරණ සහ ආයතනික පාලන කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩලයට සහ එහි කමිටු වලට පත්කිරීම සඳහා අපේක්ෂකයන් හඳුනාගැනීම සහ නම් කිරීමේ ක්‍රියාදාමයට නායකත්වය දීම, සමූහයේ විධායක කමිටුව හා අනෙකුත් ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් සඳහා අනුප්‍රාප්තික සැළසුම් සහ සංවර්ධනය අධීක්ෂණය කිරීම සහ, සමූහයේ වාණිජ පාලන යාන්ත්‍රණය නිරීක්ෂණය කිරීම ද එය මනා පරිචයන් සමග අනුකූල වන බවට වගබලා ගැනීම ද කමිටුවෙහි ප්‍රධානතම වගකීම් අතරට ඇතුළත් වේ.

සමූහ විගණන කමිටුව (GAC)

මෙම කමිටුවේ මූලික වගකීම් වන්නේ, සමූහයේ මූල්‍ය කාර්යසාධනයට අදාළ වන මූල්‍ය ප්‍රකාශන, නිල නිවේදන හා නියාමන තොරතුරු වල නිරවද්‍ය භාවය නිරීක්ෂණය කිරීම සහ තක්සේරු කිරීම, සහ වැදගත් ගිණුම්කරණ තීන්දු ගැනීමයි. මූල්‍ය වාර්තාකරණය පිළිබඳව කළමනාකාරිත්වයට නිසි අභ්‍යන්තර පාලනයක් පවතින බවට වගබලා ගැනීම ද එහි ඵලදායීතාව සමාලෝචනය කිරීම ද මෙමගින් සිදුකෙරේ. එසේම, බාහිර විගණකවරයා සමඟ ඇති සම්බන්ධතාව සමාලෝචනය කිරීම හා අධීක්ෂණය ද, එය පත්කිරීම, කාලසීමාව, මාරුවීම, වැටුප්, ස්වාධීනතාව සහ විගණන නොවන සේවාවන්ට සම්බන්ධ වීම අධීක්ෂණය කිරීම ද සඳුකෙරේ. අනතුරු හඟවන්නන්ගේ තොරතුරු ග්‍රහණය කර ගැනීම හා ඊට ප්‍රතිචාර දැක්වීම සඳහා සමූහයේ ප්‍රතිපත්ති, කාර්ය පටිපාටි සහ සැකසුම් අධීක්ෂණය කිරීම සහ ඒවා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක වන බවට වගබලා ගැනීම සහ, ගෝලීය අභ්‍යන්තර විගණනයේ කාර්යය අධීක්ෂණය ද, එහි කාර්යයන් හි ඵලදායීතාව, කාර්යසාධනය, සම්පත්දායක භාවය, ස්වාධීනත්වය සහ තත්ත්වය ද අධීක්ෂණය කෙරේ.

සමූහ අවදානම් කමිටුව (GRC)

අවදානම්-ආශ්‍රිත කරුණු සහ සමූහයට බලපෑමක් ඇති කෙරෙන අවදානම් පිළිබඳව සමූහ අවදානම් කමිටුව (GRC) වෙත විධායක නොවන සමස්ත වගකීමක් පවතී. GRC හි මූලික වගකීම් අතර: අවදානම් රුචිය පිළිබඳ කාරණා වලදී අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම මූල්‍ය අවදානම්, මූල්‍ය නොවන අවදානම්, සහ සමූහයේ චර්යා රාමුවෙහි ඵලදායීතාව ඇතුළුව අවදානම්-ආශ්‍රිත සියලු කාරණා සහ මූලික නියාමන ඉදිරිපත් කිරීම් විමසා බලා, අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම, සහ සමූහයේ ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුව සහ අභ්‍යන්තර පාලන පද්ධති වල ඵලදායීතාව [සමූහ විගණන කමිටුව (GAC) විසින් අධීක්ෂණය කරන අභ්‍යන්තර මූල්‍ය පාලනය හැර] ප්‍රතිවිමර්ශනය කිරීම සහ, සමූහයේ ආතති පරීක්ෂණ කටයුතු සමාලෝචනය සහ අභියෝගයට ලක් කිරීම.

සමූහ වැටුප් කමිටුව

මෙම කමිටුව විසින් සමූහයේ අපගේ සගයන්ගේ වැටුප් රාමුව, සහ විධායක අධ්‍යක්ෂවරුන්ගේ, සමූහ සභාපතිවරයාගේ හා සමූහයේ වෙනත් ජ්‍යෙෂ්ඨ සගයන්ගේ වැටුප් පිළිබඳ පුළුල් මූලධර්ම, පරාමිතීන් සහ පාලනය සැකසීම සම්බන්ධයෙන් වගකිව යුතු වේ. කාර්යරාමුව සමූහයේ අරමුණ, වටිනාකම්, සංස්කෘතිය සහ ක්‍රමවේද වලට සහාය දක්වන බවට වගබලා ගැනීම සඳහා මෙන්ම නිසි පරිදි අවදානම් කළමණාකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම කමිටුව විසින් එය නිරතුරුව සමාලෝචනය කරයි. විවිධ බලප්‍රදේශයන්හි නියාමන අවශ්‍යතා වලට අනුකූල වන බවට සෑහීමකට පත්වීම සඳහා ද මෙම කමිටුව විසින් කාර්යරාමුව සමාලෝචනය කෙරේ.

අභ්‍යන්තර පාලනය

අවදානම් පාලනය හා අභ්‍යන්තර පාලන පද්ධති වල කාර්යක්ෂමතාව පවත්වාගැනීම හා සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් ද, ක්‍රමවේදී අරමුණු ළඟා කරගැනීමේදී සමූහය විසින් මුහුණදීමට සූදානමින් සිටින අවදානම් වල මට්ටම හා ආකාර තීරණය කිරීම සම්බන්ධයෙන් ද මණ්ඩලය වගකිව යුතු වේ. මෙම අවශ්‍යතා ඉටුකිරීම පිණිස සහ FCA අත්පොත හා PR අත්පොත යටතේ පවතින බැඳීම් ඉටුකිරීම පිණිස, අනවසරයෙන් භාවිත කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් ආරක්ෂාවීම සඳහා ද, නිසි විගණන වාර්තා පවත්වාගැනීම සම්බන්ධයෙන් සහ, ව්‍යාපාරය තුළ හෝ පළකිරීම සඳහා හෝ භාවිත කරනු ලබන මූල්‍ය තොරතුරු වල විශ්වසනීයත්වය හා ප්‍රයෝජනවත් බව සහතික කිරීම සඳහා වන කාර්යපටිපාටි සකස් කර ඇත. මෙම කාර්යපටිපාටි මගින් භෞතිකව දෝෂසහගත ප්‍රකාශන, වැරදි, පාඩු හෝ වංචා වලට එරෙහිව සාධාරණය සහතික වීමක් සැපයිය හැකිය.

මූල්‍ය වාර්තාකරණය

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාදාමය, සමූහය තුළ සියලු වාර්තාකරණ ආයතන වෙත එක් එක් වාර්තාකරණ කාලසීමාව අවසානයට පෙර කල්තබා නිකුත් කර ඇති වාර්තාකරණ නියමයන් පිළිබඳ සවිස්තර උපදෙස් හා මගපෙන්වීම් වල සහය ඇතිව, ලේඛනගත විගණන ප්‍රතිපත්ති සහ වාර්තාකරණ ආකෘති භාවිතයෙන් පාලනය වේ. එක් එක් වාර්තාකරණ ආයතන වෙතින් මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා අදාළ වගකිවයුතු මූල්‍ය නිලධාරියාගේ සහතික කිරීම ද, වාර්තාකරණ ආයතන හා සමූහ මට්ටමින් පවතින විශ්ලේෂණ හා සමාලෝචන කාර්යපටිපාටි මගින් ද සහයෝගය ලැබේ.

හෙළිදරව් කිරීමේ කමිටුව

සමූහයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී විසින් මුලසුන දරන හෙළිදරව් කිරීමේ කමිටුව, එක්සත් රාජධානිය සහ හොංකොං ලැයිස්තුගත කිරීමේ රීති, එක්සත් රාජධානියේ වෙළෙඳපොළ අවභාවිත රෙගුලාසි හා එක්සත් ජනපද සුරැකුම්පත් හා විනිමය කොමිසමේ රෙගුලාසි ද ඇතුළත්ව අදාළ නීතිරීති හා රෙගුලාසි යටතේ සමූහයේ බැඳීම් ඉටුකිරීමට සහය ලබාදෙයි. මෙසේ සිදුකිරීමේදී එම හෙළිදරව් කිරීම් වල ආකෘතිය හා කාලය ද ඇතුළත්ව නව සිදුවීමක් හෝ තත්ත්වයන් හෙළිදරව් කළ යුතු ද යන්න තීරණය කිරීමට, සහ සමූහය විසින් සිදුකළ හෝ සිදුකිරීමට නියමිත යම් යම් හෙළිදරව් කිරීම් සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් හෙළිදරව් කිරීමේ කමිටුව වෙත බලය පවරා ඇත.

		ෆිච්		මූඩිස්		ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස්	
		ශ්‍රේණිගත කිරීම	ඉදිරි දැක්ම	ශ්‍රේණිගත කිරීම	ඉදිරි දැක්ම	ශ්‍රේණිගත කිරීම	ඉදිරි දැක්ම
හොංකොං සහ ෂැංහයි බැංකුකරණය සංස්ථාව	දීර්ඝ කාලීන/ජ්‍යෙෂ්ඨ	AA-	ස්ථාවර	Aa3	ස්ථාවර	AA-	ස්ථාවර
	කෙටි කාලීන	F1+	-	P-1		A-1+	-

HSBC

ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් (ලිමිටඩ්) යනු ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ පවතින ලියාපදිංචි බලපත්‍ර ලාභී වාණිජ බැංකුවකි.

ශ්‍රී ලංකාවේ ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් (ලිමිටඩ්) විසින් නිකුත් කරන ලදී.